# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 42 /2023 (PSC)

එස්.එම්.ටී.පී.සමරකෝන්,
අභියාචක
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.23.**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය සේවක තිස්ස ගුණතිලක මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ලසන්දනී විජේසිංහ මිය.

## -<u>නියෝගය</u>-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක මුලදී ගම්පොලවෙලේ ධම්මානන්ද හිමි ලෙස පෙනී සිට, 1999 වසරේ පළමු උපාධිය හා 2010 දී ශාස්ත්‍රපති උපාධිය හා 2002 පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත. 1999.06.01 දින සිට 2013.06.21 දින දක්වා ගම්පොල බුවනෙකබා පිරිවෙනේ සේවය කර ඇත. ඉන්පසුව රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩ සටහන යටතේ සංවර්ධන නිලධාරියෙකු ලෙස රාජ්‍ය සේවයට එක්වී ඇත. 2013.06.21 දින සිට උඩ පළාත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කර ඇත. 2013.10.21 දින සිට මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට ස්ථානමාරු ලැබ සංවර්ධන නිලධාරී ලෙස සේවය කර ඇත. 2014.06.14 දින සිට උපාධිධාරී අභ්‍යාස ලාභී භික්ෂූන් වහන්සේලා සහ සෙසු ආගමික පූජකවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර් ග්‍රහණය කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ගුරුසේවයට අන්තර් ග්‍රහණය වී ඇත. ඒ අනුව කිංස්වුඩ්

විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස සේවය කරමින් අධ්‍යාපන සුදුසුකම් මත ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II උසස්වීම් ලැබ ඇත. 2016 වසරේ පුද්ගලික අවශ්‍යතාවයක් මත උපැවිදි වීමට කටයුතු කර ඇති අතර, ඉන්පසුව එස්.එම්.ටී.පී.සමරකෝන් ලෙස ගිහි නමින් 2017.12.31 වන දින සිට මහනුවර සේනාධිකාරී ජාතික පාසලට තාවකාලික ස්ථානමාරුවක් ලබාගෙන ගුරු සේවයේ නියැලී ඇත. 2019.01.09 දින සිට නැවතත් සංවර්ධන නිලධාරී සේවයට අනුයුක්ත කර ඇත. ඒ අතරතුර අභියාචක තවදුරටත් ගුරු සේවයේ තබා ගන්නා ලෙසට ඉල්ලීම් කළද, එය ඉටුවී නැත. 2018 වසරේ ගැසට් නිවේදනය අනුව ගුරු සේවයට බඳවා ගැනීමට ඉල්ලීම් කළද, ඒ සඳහා අවස්ථාව නොලැබීම මත, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉල්ලීම් කර ඇත. 2023.02.08 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක, 2023.02.22 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ, ගුරු සේවයේ 2-II තනතුර නැවත ලබා දෙන ලෙසය. අභියාචක මේ පිළිබඳව වන තම ඉල්ලීම සනාථ කිරීම සඳහා ඇමුණුම් රැසක් ඉදිරිපත් කර සිටී. එමෙන්ම මෙම අධිකාරයේ විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ද මේ පිළිබඳව තම නිරීක්ෂණ 2024.01.04 හා 2026.03.03 ලිපි සහ ඇමුණුම් මගින් ඉදිරිපත් කර ඇත. එසේම වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. 2024.01.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ අනුව,

1. Ven Gampolawela Dhammananda Thero had been appointed to the post of Development officer by a letter dated 30.09.2013 of the Director General of combined Services. (Annexure 1)
2. Subsequently, he has been appointed to Grade I of Class 3 of Sri Lanka Teachers' Service by a letter dated 11.06.2014 of Secretary to the Ministry of Education. (Annexure 2)
3. Ven Dhammananda Thero's appointed as a teacher was an appointment of special nature due to the following reasons.
    a) It had been made by the Secretary to the Ministry of Education in pursuant to a decision of the Cabinet of Ministers.
    b) One expressed condition of the appointment was that the appointee shall be reverted to his former post (i.e., Development Officer) in the event he gives up monkhood.

This condition is clearly stated in paragraph 7 of the letter of appointment. (Annexure 2)

4. Later, Ven Dhammananda Thero had requested that he be reverted to his previous post as he intended to give up monkhood. (Annexures 3 and 4)
5. Accordingly, he has been reverted to the post of Development officer since 29.12.2016 by PSC letter dated 27.07.2017 (Annexure 5)
6. The appellant now has taken the lay name "S.M.G.T.Samarakoon" after giving up the monkhood.
7. Later, in a letter dated 15.10.2021, addressed to Senior Assistant Secretary, Ministry of Education, the Appellant had sought his reappointment as a teacher on sympathetic grounds pointing out that he could not apply for a teacher appointment at the subsequent round of teacher recruitments in 2018 as he had not formally reverted to the post of Development Officer as at that date. (Annexure 3)
8. The above request had been forwarded to Public Service Commission by the Secretary to the Ministry of Education under the cover of his letter dated 25.11.2021 (Annexure 6).
9. Commission rejected the Appellant's request as no person can be recruited to Sri Lanka Teachers' Service without following the competitive selection process stipulated in the Minute of Sri Lanka Teachers' Service (Annexure V). Commission, in making this decision, further noted that the Appellant's own letter dated 05.01.2019 (Annexure 6) seeking reversion to post of Development Officer clearly contradicted his claim that he had an intention to remain in or rejoin Sri Lanka Teachers' Service in 2018.
10. The Appellant in his instant appeal based on this same contention seeks his appointment as a teacher considering his appeal on sympathetic grounds.
11. According to section 7.2.3 of the Minute of Sri Lanka Teachers' Service, recruitment of teachers shall only be through a competitive selection process.
12. **Further, this officer knew that his appointment of teaching would be cancelled with giving up monkhood as per the provisions of**

**the appointment letter. He has given up the monkhood on 29.12.2016 and as a layman, he had chance to apply for the examination which was gazetted on 28.06.2018.**

මෙයට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලබා දී ඇති 2026.03.03 නිරීක්ෂණ අනුව,

5. The appellant expressly admits that he cannot seek appointment as a Teacher in accordance with provisions of the Minute of Sri Lanka Teachers' Service. Thus, he seeks a teaching position on "compassionate grounds".

6. An appointment authority in the Public Service has no authority to make appointments deviating from the provisions of the relevant Service Minute or the Scheme of Recruitment in ad hoc manner to please individuals. Yasantha Kodagoda, Pc, J. in D.S.D.R. Fernando and others v Hon Chamal Rajapaksa, State Minister of Home Affairs, and others (SCFR 112/2021 decided on 29.05.2025, p.23)

අදාළ සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී, මෙම අධිකාරයට පැහැදිලි වන්නේ,

1. අභියාචක උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩ සටහන යටතේ පිරිවෙනක රාජකාරී කරමින් සිට සංවර්ධන නිලධාරියෙකු ලෙස රාජ්‍ය සේවයට එක්ව ඇති බව,
2. 2013.09.05 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව උපාධිධාරී භික්ෂූන් වහන්සේලා හා අනෙකුත් ආගමික පූජකතුමන්ලා වෙත අදාළ ආගමික ජීවිතයේ යහ පැවැත්ම/විශේෂ පිළිගැනීම යටතේ ගුරු පත්වීම් ලබා දී ඇති බව. කොන්දේසි සහිතව.
3. අදාළ පත්වීම් ලිපියේ කොන්දේසි උල්ලංඝනය වුවහොත් (පැවිදි ජීවිතය අත්හැරීම තුළින්) නැවත පෙර සිටි තනතුරට යායුතු බව දැන සිටි බව,
4. 2016.09.25 ලිපිය මගින් සංවර්ධන නිලධාරී සේවයට පත්කරන ලෙස අභියාචක ගේ ඉල්ලීම,
5. 2019.01.05 දිනැති අභියාචකගේ ලිපියෙන් නැවත සංවර්ධන නිලධාරී සේවයේ කටයුතු කිරීමට ඉඩ සළසා දෙන ලෙස ඉල්ලීම,

6. **2018** වසරේ පැවැත්වූවා යැයි සඳහන් ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය සඳහා අයදුම්කරුට සුදුසුකම් නොමැති බව,

7. SCFR 117/2021 දරණ නඩුවේ තීන්දුව අනුව ගුරු සේවයට පත්වීම් ලබා දීමේ දී තරග විභාගයක් මගින් පත්වීම් ලබාදීම ස්ථිර කර ඇති බව හා ඒ අනුව තරග විභාගයට ඉදිරිපත් වී ඒ සඳහා කටයුතු කිරීමට අභියාචකට ද අවස්ථාව සැළසී ඇති බව,

8. සානුකම්පිත හේතූන් මත හෝ ආර්ථික දුෂ්කරතා මත ගුරු තනතුර ලබාදෙන ලෙස කරන ඉල්ලීම සළකා බැලීමට ඉඩ ප්‍රස්ථා නොමැති බව,

9. දැනටමත් අභියාචක සංවර්ධන නිලධාරි ලෙස රාජ්‍ය සේවයේ තනතුර ලැබී ඇති බව.

ඉහත සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී අභියාචකගේ ඉල්ලීම පිළිගැනීම සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කර නැති බව පෙනේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී ඇති තීරණයන් වෙනස් කිරීමට මෙම අවස්ථාවේ දී මෙම අධිකාරය අපේක්ෂා කරන්නේ නැත. එම තීරණය ස්ථිර කරමු. ඒ අනුව අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු. ඒ බැව්, අභියාචක, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-